# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)- 11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2013.08.02

වේළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : 01/2013

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත,

<u>සහනදායි මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම</u>

2010.12.10 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2010 හා එහි සංශෝධන මගින් රාජ්‍ය සේවයෙහි, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විධායක මට්ටමේ පරිපාලන, කළමනාකරණ නිලධාරීන් සහ වෘත්තීමය තනතුරුවල නිරතවන නිලධාරීන් සඳහා සහනදායි කොන්දේසිවලට යටත්ව මෝටර් රථ ආනයනය කිරීමට/නව කොටස් සහ උපාංග යොදා දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථ මිලදී ගැනීමට බලපත්‍ර ලබාදීම 2010 දෙසැම්බර් 15 වන දින සිට ක්‍රියාත්මක වේ.

ඉහත චක්‍රලේඛය හා එහි සංශෝධනයන්හි අඩංගු සහන ද ඇතුලත් කරමින් මෙම 01/2013 නව චක්‍රලේඛය නිකුත් කරන අතර <u>එය 2013.08.05 දින සිට ක්‍රියාත්මක වේ</u>. ඒ අනුව 2010.12.10 දිනැති 1/2010, 2010.12.24 දිනැති 01/ (01)/2010, 2012.02.13 දිනැති 01/(02)/2010 හා 2012.11.09 දිනැති 01(03)/2010 යන චක්‍රලේඛ සියල්ල මෙදින සිට අවලංගු වේ.

**01.** යෝග්‍යතාව

**01.01** මෙම චක්‍රලේඛයේ කොන්දේසි හා නියමයන්ට අනුව බදු සහන මත මෝටර් රථ ආනයන බලපත්‍ර ලබා ගැනීම සඳහා හිමිකම් ලබන නිලධාරීන්

(අ) 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි සඳහන් "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හය (06) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්

(ආ) "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හය (06)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සලසා ඇති විධිවිධාන ප්‍රකාරව පිහිටුවා ඇති කොමිෂන් සභාවක වසර තුනක සක්‍රීය සේවා කාලයක් සහිත කොමිෂන් සභා සභාපතිවරු හා සාමාජිකයින්

(ඈ) අමාත්‍ය මණ්ඩල තීරණයකින් රජයේ ආයතනවල "ජ්‍යෙෂ්ඨ මට්ටමේ" විධායක තනතුරකට පත්කර ඇති සහ එම තනතුරේ වසර හය (06)ක සක්‍රීය සේවා කාලයක් සහිත නිලධාරීන්

(ඉ) i. විශ්ව විද්‍යාල කුලපතිවරුන්

ii. විශ්ව විද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර අට (08)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අදාල තනතුරේ ස්ථිර කර ඇති නිලධාරීන්

(ඊ) i. වසර හය (06)ක සක්‍රිය සේවා කාලයක් හිමි ත්‍රිවිධ හමුදාවන්හි ලුතිනන් කර්නල්, වින්ග් කමාන්ඩර්, කමාන්ඩර් හෝ ඊට ඉහල තනතුරක ස්ථිර කර ඇති නිලධාරීන්

ii ත්‍රිවිධ හමුදාවන්හි සේවය සඳහා බඳවා ගැනීමෙන් පසු වසර හය (06)ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ තනතුරෙහි ස්ථිර කර ඇති වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරීවරුන්, වාස්තු විද්‍යාඥයන් හා නීතිඥවරුන් (හමුදා නිලය නොසලකා)

(උ) මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක වසර දොළහ (12)ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ III ශ්‍රේණිය හා ඊට ඉහල ශ්‍රේණියක තනතුරක් දරණ ශ්‍රී ලංකා මහ බැංකුවේ "ජ්‍යෙෂ්ඨ මට්ටමේ" විධායක නිලධාරීන් සහ නියාමන ආයතනවල "ජ්‍යෙෂ්ඨ මට්ටමේ" විධායක තනතුරක වසර දොළහ (12)ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්

(ඌ) i. රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි "ජ්‍යෙෂ්ඨ මට්ටමේ" විධායක තනතුරක වසර දොළහ (12) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාල තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්

ii. රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි "ජ්‍යෙෂ්ඨ මට්ටමේ" විධායක තනතුරක වසර නවය (09)ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අදාල තනතුරෙහි ස්ථිර කර ඇති වරලත් ඉංජිනේරුවන්, වරලත් ගණකාධිකාරීවරුන්, වරලත් වාස්තු විද්‍යාඥයින්

(එ) රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා පත්කර ඇති වසර නවය (09)ක සක්‍රිය සේවා කාලයක් හිමි ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, වරලත් ඉංජිනේරුවන්, වරලත් ගණකාධිකාරීවරුන්, වරලත් වාස්තු විද්‍යාඥයින් හා නීතිඥවරුන්

(ඒ) මෙම චක්‍රලේඛය සඳහා සක්‍රිය සේවය යන්නෙන් අදහස් කරනුයේ සුදුසුකම් ලබන තනතුරක් සඳහා නිලධාරියාගේ සේවා කාලය ගණනයේදී වැඩ තහනමකට ලක්වීම මත හෝ වැටුප් රහිත නිවාඩු (පශ්චාත් අධ්‍යාපන කටයුතු සඳහා වන නිවාඩු හැර) ලබා ගැනීම මත හෝ අදාල තනතුරට පත්වීම පෙරදාතම කිරීම මත වන්නාවූ කාලය නොසලකා ගණනය කරනු ලබන සේවා කාලය වේ.

## 01.02 හිමිකම් නොලබන විශේෂ අවස්ථා

i. අයදුම්පත් ඉදිරිපත් කරන දිනට පූර්වාසන්න වසර පහ (05)ක කාලයක් තුලදී බදු සහන යටතේ මෝටර් රථයක් ආනයනය කර හෝ දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථයක් මිලදී ගෙන හෝ ඇති නිලධාරීන් (එහිදී වසර පහක කාලය ගණනය කරනු ලබන්නේ ආනයනය කරන ලද මෝටර් රථයක් නම් ඊට අදාල ණයවර ලිපිය විවෘත කරන ලද දිනයේ සිට සහ දේශීයව මිලදී ගන්නා ලද මෝටර් රථයක් නම් එහි පළමු ගෙවීම සිදුකල දිනයේ සිට වේ).

ii. වැටුප් රහිත නිවාඩු මත දැනට නිදහස් කර ඇති නිලධාරීන්

iii. මෙම චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් ලබන තනතුරකට හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ වැටුප් ක්‍රමයකට පෞද්ගලික වන සේ හෝ අධිසේවක පදනම මත පත්කර වැටුපක් ලබාදී ඇති හෝ නිලධාරීන්

iv. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් පසුව කොන්ත්‍රාත් පදනම මත මෙම චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් ලබන තනතුරක් සඳහා පත්කර ඇති නිලධාරීන්

v. යම් නිලධාරියෙකුට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර දැනට එම ක්‍රියාමාර්ගය අවසන් කර නොමැති නිලධාරීන්

vi. කවර හෝ බදු සහන ක්‍රමයක් යටතේ මෝටර් රථයක් ආනයනය කර නැවත බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේදී ආසන්නතම ආනයනයේ සිට වසර 05ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්

## 02. කොන්දේසි, නියමයන් සහ සහන

### 02.01 කොන්දේසි සහ නියමයන්

(අ) i. මෙම ක්‍රමය යටතේ පහත සඳහන් ජාත්‍යන්තර ව්‍යවහාර මුදල් වටිනාකම (මි.ර.ගැ. වටිනාකම) තුළ මෝටර් රථයක් ආනයනය/මිලදී ගැනීම කල හැකිය. මෙම මි.ර.ගැ. වටිනාකම් පහත දැක්වේ.

| මුදල් ඒකකය | මි.ර.ගැ. (CIF) වටිනාකම | | |
|---|---|---|---|
| | තීරු (1) | තීරු (2) | තීරු (3) |
| ඇ.එ.ජ. ඩොලර් | 25,000 | 30,000 | 35,000 |
| යෙන් | 2,100,000 | 2,520,000 | 2,940,000 |
| යූරෝ | 20,000 | 24,000 | 28,000 |
| එක්සත් රාජධානි පවුම් | 16,000 | 19,200 | 22,400 |
| ඉන්දියානු රුපියල් | 1,300,000 | 1,560,000 | 1,820,000 |

2.1 වගුව

ii. ඉහත 2.1 වගුවෙහි දැක්වෙන උපරිම මි.ර.ගැ. සීමාව ඉක්මවා මෙම ක්‍රමය යටතේ කිසියම් මෝටර් රථයක් ආනයනය කලහොත් එය සාමාන්‍ය ආනයනයක් සේ සලකා (බදු සහන රහිත) අදාල සියළු බදු සහ ගාස්තු ශ්‍රී ලංකා රේගුව විසින් අය කෙරෙනු ඇත. එවැනි අවස්ථාවලදී බලපත්‍ර ලාභියා වෙත නැවත බලපත්‍රයක් නිකුත් කරනු නොලබන අතර මෙම චක්‍රලේඛය උල්ලංඝණය කිරීම පිළිබදව ආයතන සංග්‍රහයේ විධිවිධාන යටතේ ද බලපත්‍ර ලාභියාට එරෙහිව කටයුතු කරනු ලැබේ.

iii. ඉහත මි.ර.ගැ. වටිනාකම යටතේ ආනයනය කරනු ලබන මෝටර් රථ සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් අනුමත තක්සේරු වටිනාකම විශාල ලෙස වෙනස් වන අවස්ථාවන්හිදී රේගු ආඥා පනත යටතේ අදාල නියෝජිතයන්ට එරෙහිව ක්‍රියා කෙරෙනු ඇති අතර එම බලපත්‍රය නිකුත් කල ප්‍රතිලාභියාටද ඉදිරියේදී නැවත බලපත්‍රයක් නිකුත් කරනු නොලැබේ.

iv. ඉහත 2.1 වගුවෙහි දැක්වෙන මුදල් ඒකක හැර වෙනත් විදේශ මුදල් ඒකක යටතේ මෝටර් රථයක් ආනයනය කරන්නේ නම් ඊ සඳහා අදාල කර ගත යුත්තේ 2013.08.05 පැවති විනිමය අනුපාතයන්ය.

(ආ) i. මෙම ක්‍රමය යටතේ අළුත්ම (Brand New) හෝ වසරකට නොවැඩි සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 87.03 යටතට ගැනෙන, කාර්, ජීප්, ස්ටේෂන් වැගන් සහ කැබ් රථ පමණක් ආනයනය/මිලදී ගැනීම කලයුතුය.

ii. පාවිච්චි කරන ලද වාහන ආනයනයේ දී අදාල වාහනයේ වසරක කාලය වශයෙන් සලකනු ලබන්නේ, අංක 1681/14 හා 2010.11.22 දිනැති ගැසට් පත්‍රයට අනුව, වාහනය ප්‍රථම වරට ලියාපදිංචි කල දිනය හා නැව්ගත කල දිනය අතර කාලයයි.

(ඇ) මෙම ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන/ මිලදී ගනු ලබන මෝටර් රථයක් ඕනෑම අවස්ථාවකදී වෙනත් පාර්ශවයකට පැවරිය හැකිය.

(ඈ) මෙම ක්‍රමය යටතේ සුදුසුකම් ලබන නිලධාරියෙකු දරණ තනතුරු ගණන නොසලකා එක් මෝටර් රථයක් ආනයනය කිරීම සඳහා පමණක් හිමිකම් ලබනු ඇත.

(ඉ) ඉදිරිපත් කර ඇති තොරතුරු සාවද්‍ය යයි තහවුරු වුවහොත් නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලබන අතර අදාල සියළුම බදු නැවත රජයට ගෙවිය යුතු අතර එවැනි සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන යටතේ කටයුතු කරනු ඇත.

(ඊ) නිකුත් කරනු ලබන බලපත්‍රයක් වලංගු වන්නේ එය නිකුත් කල දින සිට වසරක කාලයක් දක්වා පමණි. පිළිගත හැකි හේතුවක් මත එම කාලය තුල ණයවර ලිපියක් විවෘත කල නොහැකි වූ විට එවන් බලපත්‍රයක් තවදුරටත් දීර්ඝ කරනු ලබනුයේ මාස 6ක කාලයක් දක්වා පමණි ( බලපත්‍රය අවලංගු වීමට පෙර එය දීර්ඝ කරවා ගැනීම අනිවාර්ය වේ).

(උ) මෙම ක්‍රමය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමෙන් පසු එහි වලංගු කාලය ඉකුත්වීමට ප්‍රථම හෝ මෝටර් රථය ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීම හෝ මෝටර් රථය නැව්ගත කර තිබියදී බලපත්‍ර ලාභියා මියගිය හොත් එම බලපත්‍ර ලාභියාගේ නීත්‍යානුකූල හිමිකම ඔහුගේ/ඇයගේ කලත්‍රයාට ලබාගත හැකිය.

## 02.02. බදු

(අ) පහත 2.2 වගුවෙහි දක්වා ඇති පරිදි ආනයනය කරනු ලබන මෝටර් රථයේ එන්ජින් ධාරිතාව හා පි.ර.ගා. වටිනාකම පදනම් කර බදු ගණනය කිරීම සිදුකරනු ලැබේ. එකතුකළ අගය මත බදු (VAT), වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ((PAL) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) ඇතුළුව බලපත්‍ර ලාභියා විසින් ගෙවිය යුතු මුළු බදු ප්‍රමාණයට ගැලපෙන පරිදි නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු හා රේගු බදු ගැලපීම ශ්‍රී ලංකා රේගුව විසින් සිදුකරනු ලබයි.

| සිලින්ඩර ධාරිතාවය (පෙට්‍රල් / ඩීසල්) | 2.1 වගුවෙහි සඳහන් පි.ර.ගා. වටිනාකම (CIF) මත ගෙවිය යුතු බදු ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|
| | තීරු (1) | තීරු (2) | තීරු (3) | (3 ) වන තීරුවේ සඳහන් උපරිම වටිනාකම ඉක්මවීම |
| 1000cc | 60 | 75 | 90 | කිසිදු බදු සහනයක් හිමි නොවන අතර සාමාන්‍ය ආනයනයක් සේ සලකා බදු අයකරනු ලැබේ. |
| 1600cc | 65 | 80 | 100 | |
| 2000cc | 70 | 100 | 125 | |
| 2600cc | 80 | 110 | 135 | |
| 2600cc ට වැඩි | 100 | 125 | 150 | |

2.2 වගුව

(ආ) 2013.08.05 දිනට පෙර ණයවර ලිපි විවෘත කරන ලද බලපත්‍ර ලාභීන් සඳහා 2.1වගුවෙහි සහ 2.2 වගුවෙහි සඳහන් සංශෝධන අදාළ නොවේ.

## 03. ක්‍රියා පටිපාටිය

(අ) මෙම ක්‍රමය යටතේ බලපත්‍රයක් ලබාගැනීමට සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් පමණක් මෙම චක්‍රලේඛයේ ඇමුණුම I යටතේ දැක්වෙන අයදුම්පත්‍රය මගින් ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු වේ (පරිගණක ගත කිරීමේ පහසුව සඳහා ඉල්ලුම්පත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කල යුතුය).

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් ලියකියවිලි ද සමග අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කල යුතුය.

i. පළමුවරට බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේදී අදාල තනතුරට පත්කිරීමේ හා ස්ථිර කිරීමේ ලිපිය

ii. දෙවන වරට හෝ ඊට පසු සෑම වාරයකදීම බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී බදු සහන යටතේ මෝටර් රථයක් ආනයනය කිරීම සඳහා අවසන් වරට විවෘත කරන ලද ණයවර ලිපියේ පිටපතක්/දේශීයව මිලදී ගත් මෝටර් රථයක් නම් ප්‍රථම ගෙවීම සිදුකල බිල්පතේ පිටපතක්

iii. ණයවර ලිපියේ පිටපතක් ඉදිරිපත්කල නොහැකිවිට අදාල මෝටර් රථයේ රේගු සටහන්කරයේ (CUS DEC)හෝ මුල් ලියාපදිංචි සහතිකයේ පිටපතක්

(ඇ) මෙම ක්‍රමය යටතේ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ බලපත්‍ර ලාභියා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු පදනම් කරගෙන බැවින්, එම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව තහවුරු කර ගැනීමෙන් පසු පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අයදුම්පත්‍රය පෞද්ගලිකවම නිර්දේශ කල යුතුවේ.

(ඈ) දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්/පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් බලපත්‍රය නිකුත් කරනු ඇත. එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම පිටපතක් අධ්‍යක්ෂ ජනරාල් - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා රේගුව, කොමසාරිස් ජනරාල් - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත නොපමාව යොමුකල යුතුය. අදාල නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුවට ද පිටපතක් අනිවාර්යයෙන්ම ඇතුලත් කල යුතුය.

## 04. අනෙකුත් කරුණු

(අ) මෙම චක්‍රලේඛය යටතේ බලපත්‍ර ලබාගැනීමට සුදුසුකම් ලබන තනතුරු හා විධිවිධාන පිළිබඳ අර්ථ නිරූපණය හා අවිනිශ්චිතතාවයන් සම්බන්ධයෙන් ගැටළු ඇති වුවහොත් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විමසිය යුතු අතර එකී කරුණු පරීක්ෂාකර බලා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත තීම්කම ලැබීම පිළිබඳ භාණ්ඩාගාරයේ ලේකම් ගේ තීරණය අවසන් තීරණය වන්නේය.

(ආ) මෙම චක්‍රලේඛයේ විධි විධානවලට අනුකූලව සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කිරීම සෑම අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ/පළාත් සභා ප්‍රධාන ලේකම්වරයෙකුගේ ම වගකීම වේ.

(ඇ) මෙම යෝජනා ක්‍රමය යටතේ වාහන රාශියක් ආනයනය වන බැවින් හා එමගින් රාජ්‍ය සේවයේ බදු සහන මත විශාල වක්‍ර වියදමකින් දිරිගැන්වීමක් අපේක්ෂිත නිසා සෑම මාස තුනකට (3) වරක් ශ්‍රී ලංකා රේගුව විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ නිදහස් කරන වාහනවලට අදාළ තොරතුරු කළමනාකරණ විගණනයටද ලක් කරනු ලැබේ.

(ඈ) රාජ්‍ය නිලධාරීන්ට තමන් දරණ තනතුරු අනුව බදු සහන යටතේ මෝටර් රථ ආනයනයට අවස්ථාව සලසා දීම ඔවුන්ට පෞද්ගලික වන සේ ලබාදී ඇති සුවිශේෂී වරප්‍රසාදයකි. නිලධාරියාගේ අවශ්‍යතාව අනුව බලපත්‍රය යටතේ ආනයනය කල මෝටර් රථය අන් අයෙකුට පැවරීමට පරිපාලනමය බාධාවක් නොමැති වුවද එසේ පැවරීමෙන් එම බලපත්‍රයට අදාල කොන්දේසි උල්ලංඝණය නොකිරීමට බලපත්‍ර ලාභියා මෙන්ම පැවරුම් ලාභියාද වග බලාගත යුතු අතර එසේ උල්ලංඝණය වන අවස්ථාවන්හිදී පවත්නා නීති යටතේ ඔවුන්ට විරුද්ධව කටයුතු කෙරෙනු ඇත. තවද, රාජ්‍ය නිලධාරීන්ගේ බලපත්‍ර භාවිතා කර මෝටර් රථ ආනයන කරුවන් විසින් සිදුකරන විවිධ අක්‍රමිකතා හේතුවෙන් රජයේ ආදායමට වන අහිතකර බලපෑම වලක්වාලමින් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හිමිකම ලබන සියළුම රාජ්‍ය නිලධාරීන් සතු වගකීමකි.

පී.බී. ජයසුන්දර
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්.

පිටපත් :

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
04. විගණකාධිපති
05. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
06. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
07. කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
08. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව